කැලණිය විශ්වවිද්‍යාලය -- සමාජීය විද්‍යා පීඨය
2015/2016 අධ්‍යයන වර්ෂය
ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන වසර
දෙවන අර්ධ වාර්ෂික පරීක්ෂණය - (2018 ජනවාරි)

සමාජ සංඛ්‍යානය
SOST 22232 : දත්ත රැස්කිරීම හා සමීක්ෂණ කළමනාකරණය

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න**

ප්‍රශ්න සංඛ්‍යාව : 07 යි.
කාලය : පැය 02 යි.

---

01. අ. පහත දැක්වෙන ප්‍රකාශ උදාහරණ සහිතව දක්වන්න.

i. "අධ්‍යයනයකදී අභ්‍යන්තර දත්තවලට වඩා බාහිර දත්ත විශ්වාසනීය වේ."

ii. "සංඛ්‍යාන සමීක්ෂණවලට සාපේක්ෂව සංඛ්‍යාන පරීක්ෂණ සඳහා පර්යේෂණ ආචාරධර්මවල බලපෑම වැඩිය."

iii. "ප්‍රාථමික දත්ත සහ ද්විතීයික දත්ත යන දෙවර්ගයම යොදාගත හැකි අවස්ථාවකදී ප්‍රාථමික දත්ත වඩාත් යෝග්‍ය වේ."

iv. "අධ්‍යයනයක් සඳහා පවතින ද්විතීයික දත්ත දැඩි විමසීමකින් තොරව පිළිගත යුතු නොවේ.

(ලකුණු 3 x 4)

ආ. අධ්‍යයනයක් සඳහා යොදාගනු ලබන මූලික දත්ත ප්‍රභව හඳුන්වා ඒවායෙහි සාපේක්ෂ වාසි අවාසි දක්වන්න.

(ලකුණු 08)

02. අ. දත්ත රැස්කිරීමේ ප්‍රශ්නාවලි ක්‍රමය (Questionnaire Method) උදාහරණ සහිතව විස්තර කරන්න.

(ලකුණු 06)

ආ. ප්‍රශ්නාවලි ක්‍රමය මගින් දත්ත එක්රැස් කිරීම සාර්ථක කරගැනීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග දක්වන්න.

(ලකුණු 06)

ඇ. ප්‍රශ්නාවලි ක්‍රමයේ සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමයේ සාපේක්ෂ වාසි සහ අවාසි විවේචනාත්මකව විමසන්න.

(ලකුණු 08)

06. අ. ස්තෘත සසම්භාවී නියැදීම සහ පොකුරු නියැදීම යෝග්‍ය වන අවස්ථා උදාහරණ සහිතව දක්වන්න.

(ලකුණු 06)

ආ. ස්තෘත සසම්භාවී නියැදුම් ක්‍රමයෙහි සහ පොකුරු නියැදුම් ක්‍රමයෙහි සාපේක්ෂ වාසි සහ අවාසි විමසන්න.

(ලකුණු 06)

ඇ. සසම්භාවී නියැදුම් ක්‍රම යටතේ දැක්වෙන ස්තෘත සසම්භාවී නියැදුම් ක්‍රමය සහ නිස්සසම්භාවී නියැදුම් ක්‍රම යටතේ දැක්වෙන කොටස් නියැදුම් ක්‍රමය අතර පවතින සමාන අසමානකම් වෙන් වෙන්ව දක්වන්න.

(ලකුණු 08)

07. පහත සඳහන් මාතෘකා යටතේ උදාහරණ සහිතව කෙටි සටහන් ලියන්න.

i. සම්මුඛ සාකච්ඡා ක්‍රමයේදී යොදාගනු ලබන පුහුණු සමීක්ෂකයෙකු සතු විය යුතු ගුණාංග.
ii. ප්‍රශ්නාවලියක අන්තර්ගත වන ප්‍රශ්න වර්ග
iii. හිමබෝල නියැදීම
iv. පර්යේෂණ ආචාරධර්ම

(ලකුණු 05 x 4)